**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදීවංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හාසිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රීලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර ඇති කරගෙන තිබූ අවබෝධතා ගිවිසුම අනුව අක්කර 7, රූඩ් 2, පර්චස් 8.41 ක භූමියරු.මිලියන 11,700 කට අගය කර තිබුණි. එහි මූලික ගෙවීම ලෙස රු. මිලියන 1,500 ක් හා රු. මිලියන 300 බැගින් වසර 34 ක කාල සීමාවකට අඛණ්ඩව කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වනවිට එයින් රු. මිලියන 2,250 ක් ගෙවා තිබුණි. ඒ අනුව අවබෝධතා ගිවිසුම අනුව නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු ලෙස රු. මිලියන 9,450 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2021 ඔක්තෝබර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/21/1734/331/009 අනුව කොමිෂන් සභාව විසින් ගෙවා ඇති රු. මිලියන 2,250 ක මුදලකට උක්ත අවබෝධතා ගිවිසුමේ දැක්වෙන නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව තිබුණු භූමි ප්‍රමාණයෙන් අක්කර 4 රූඩ් 3 පර්චස් 24.47 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් විකුණුම් ඔප්පුවකින් කොමිෂන් සභාව වෙත පවරා තිබුණු අතර ඉතිරි අක්කර 2 රූඩ් 02 පර්චස් 22.08 ක ඉඩම් ප්‍රමාණය දීමනා පත්‍රයක් මගින් කොමිෂන් සභාව වෙත පවරා දී තිබුණි. 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මගින් කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් ගෙවිය යුතු මුදල හා එම වටිනාකමට සමාන ප්‍රමාණයක් අදාළ | අදහස් දක්වා නැත | ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වත්කමේ වටිනාකමින් ඉවත් කර තිබුණි. එසේ වුවද නෙලුම් කුලුන ස්ථාපිත කර ඇති භූමිය මේ වන විටත් භාවිතා කරන බැවින් එලෙස ගෙවිය යුතු වගකීම සහ ඉඩමේ ගිණුම්ගත කර තිබූ වටිනාකමින් කොටසක් ඉවත් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව ඉඩමේ සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපනය කර නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20හි 23 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ කොළඹ නෙලුම් කුලුන පිහිටි ඉඩම ප්‍රදානයක් ලෙස කොමිෂන් සභාව වෙත ලැබී තිබුණද එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනවන විට මෙම ඉඩම ප්‍රත්‍යාගණනය කිරීම අවසන්වී නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 23 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 07ප්‍රකාරව තත්‍ය වශයෙන් ලැබුණු පොලී හා ලාභාංශ පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු පොලී හා ලාභාංශ රු. 1,150,434,945 ක් සහ ලැබිය යුතු පොලිය වන රු. 241,310,274 ක් ඇතුළුරු. 1,341,809,603 ක් මුළු පොලී හා ලාභාංශ මුදල් ගලා ඒම් ලෙස දක්වා එම වෙනස (ලැබිය යුතු පොළිය රු. 241,310,274) කාරක ප්‍රාග්ධන ගැලපීම් තුළින් ගලපා තිබුණි. | අයෝජන ක්‍රියාකාරකම් යටතේ ලැබිය යුතු පොලිය වන රු. 241,310,274 ක වටිනාකම කාරක ප්‍රාග්ධන ගැලපීම තුළින් නිවැරදිව ගලපා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. කරුණාකර සටහන් අංක 22-1 වෙත ඔබගේ අවධානය යොමු කරමි. | මුදල් ප්‍රවාහය අනුව ශුද්ධ මුදල් ගලා ඒම් පමණක් ගලපාමුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 07අනුව මුදලින් ගෙවූ ණය පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතු වුවද වර්ෂය තුළදීඑක්සිම්බැංකු ණය ලෙසරු. 1,833,493,891ක් ගෙවා තිබුණද එයරු. 452,549,828ක් ණය ගෙවීම් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන්මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාම් රු. 1,380,944,063 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙහිදී එක් සිම් බැංකු ණය සඳහා ගෙවන ලද ණය වටිනාකමෙන් එක් වාරිකයක් ප්‍රාග්ධනිත කර ඇති බැවින් හා ඉතිරි වාරිකය ගෙවීම ප්‍රමාද කළ බැවින් ලාභයට හා ශේෂ පත්‍ර සටහන් අනුව මුදලින් කළ ගෙවීමේ ශුද්ධ අගය පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති බව කරුණාවෙන් සලකන්න. එය ද්විත්ව සටහන් අනුව වර්ෂයේ ලාභයට නිවැරදිව ගලපා ඇත. | මුදලින් කළ නිවැරදි ගෙවීම මුදල් ගලා යාම් ලෙස දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී අලුත්වැඩියා / නඩත්තු වියදමක් ලෙස ගිණුම්ගත කළ රු. 625,000ක ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ | වැරදි නිවැරදි කිරීම සඳහා රු. 625,000 ක මුදල සඳහා යොදන ලද සටහන නිවැරදිව ද්විත්ව | සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ මුදල් ගලා යාම් පමණක් ගලපා |

| | | | |
|---|---|---|---|
| | වියදමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලාභයට ගලපනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ මුදල් ගලා යාමක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | සටහන් මගින් ගිණුම්ගත කිරීම තුළ ලාභය ගණනය කිරීමේදී නිවැරදි ලෙස ගැලපී ඇත. මෙහිදී ද්විත්ව සටහන් මූලධර්මය යටතේ වැරදි නිවැරදි කිරීමේ සටහන මගින් ලාභය අඩුකර ස්ථාවර වත්කම් වැඩිකර දක්වා තිබේ. ලාභය අඩුවීම තුළින් වර්ෂයේ වියදම අඩුකර තිබේ. මුදලේ ශුද්ධ බලපෑම නිවැරදිව ගැලපී ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ මුදලින් සිදුකරන ලද රු. 2,900,000,000 ආයෝජන ක් වුවත්රු. 112,328,477 ක් වූ ජ'නල් සටහන් මගින් භාණ්ඩාගාර බැඳුම්කරවල නාමික අගයට වඩා වැඩියෙන් ගෙවූ වටිනාකමින් සමාලෝචිත වර්ෂයට අදාළව ආදායම් ප්‍රකාශයෙන් කපා හල අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලාභයට ගලපනවා වෙනුවට වර්ෂය තුළ මුදලින් සිදු කරන ලද ආයෝජනවලින් එම වටිනාකම අඩුකරරු. 2,787,671,522.ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාම්රු. 112,328,477 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ආයෝජන වටිනාකම අනුව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී හඳුනාගෙන ඇත. ස්ථාවර තැන්පතු පමණක් නොව අනෙකුත් ආයෝජනයන් හි වර්ෂය තුල වෙනස්වීම නිවැරදි ලෙස ගලපා ඇති බව කරුණාවෙන් සලකන්න. | නිවැරදි මුදල් ගලා යාම් දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙළ කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු අගය ශුන්‍ය වූ රු. 1,075,740,531 ක වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා බැවින් එම දේපළ පිරියත හා උපකරණවල වටිනාකම නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මූලික පියවරක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ එක්ව මේ වනවිටත් සියලුම ඉඩම් (කදිරාන හැර) ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම ප්‍රත්‍යාගණනය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට කටයුතු කරමු. අනෙකුත් ගොඩනැගිලි, විදුලි සංදේශ කුලුනු සහ අනෙක් සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට පරිපාලන අංශය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර අදාළ මූලික කටයුතු ආරම්භ කොට ඇත. තක්සේරු දෙපාර්තමේන්තුවේ පවතින ප්‍රමාදය මෙයට හේතුවී ඇත. | ගිණුම්කරණ ප්‍රමිතප්‍රකාරවවත්කම්ව ල සාධාරණ අගය ගිණුම්ගත කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂයේ බේරුම්කරණ වියදම රු. 296,483,458ක් වුවද එයට අදාළ රු. | එකඟ වෙමු. | මූල්‍ය ප්‍රකාශනවල එකතු කළ අගය මත |

| | | | |
|---|---|---|---|
| | 44,472,518ක් වූ අදාළ එකතු කළ අගය මත බදු බේරුම්කරණ වියදමට ගලපා ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභයරු. 44,472,518කින් අඩුවෙන් දක්වා තිබුණි. | | බදු වගකීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2022 නොවැම්බර් වර්ෂයට අදාළකොළඹ නෙලුම් කුලුන වෙනුවෙන් ගෙවූ රු. 2,454,017ක රක්ෂණාවරණ මුදලින් රු. 409,002ක් පමණක් එම ගිණුමට හරකර රු. 2,045,014ක් ඉදිරියට කළ ගෙවීම් ගිණුමට හරකර තිබුණි.ඒ හේතුවෙන්සමාලෝචිත වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් රු. 2,045,014 කින් වැඩියෙන්දක්වා තිබුණි. | එකඟ වෙමු. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2022 ඔක්තෝබර් සිට 2023සැප්තැම්බර් 30දින දක්වා කාල පරිච්ඡේදය සඳහා කාර්යමණ්ඩලයේ ජීවිත රක්ෂණාවරණය වෙනුවෙන් ගෙවූ රු. 2,975,382 ක මුදල 2022 වර්ෂයේ උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ මාස 09 කට අදාළ රු. 2,231,536 ක වියදම උපචිත වියදමක් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟවෙමු. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සේවා ගිවිසුම් කඩකිරීම් හේතුවෙන් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 1,878,060 ක ඇප බැඳුම්කර වටිනාකම ලැබිය යුතු වැටුප් අවකරණ ගිණුමේ වත්කමක් ලෙස දක්වා විලම්භීත ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට උපචිත වියදම් යටතේ දක්වා තිබුණි. | එකඟ වෙමු. | විලම්භිත ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගැනීම් හා වියදම් සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවතින එකතුව රු. 1,282,800 ක්, කෙරීගෙන යන වැඩ හා වියදම් ලෙස උපචිත වියදම් ගිණුමක ගිණුම්ගත කිරීම නිසා වියදම් හා ජංගම වගකීම් වැඩියෙන් දක්වා තිබුණි. | KVA UPS 6 ක් රු.450,000 කට මිලදීගැනීමටත්, ඩොට් මැට්‍රික්ස් ප්‍රින්ටර් 01 ක් රු. 160,000 කට මිලදී ගැනීමටත් 2022 වර්ෂය තුළ කටයුතු කර අවසන් කර තිබූ බැවින් මෙම වියදම 2022 වර්ෂයට අදාළව උපචිත වියදමක් ලෙස සලකා ඇත.<br>රු.156,850 ට අදාළව සහ රු. 515,950 ට අදාළ කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සඳහා "සත්මිණ | ප්‍රසම්පාදන කටයුතු අවසන් වූ හා වියදම දැරූ අවස්ථාව නිශ්චිතව හඳුනාගෙන වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කන්ස්ට්‍රක්ෂන්''' ආයතනය වෙත ටෙන්ඩරය 2022 වර්ෂය අවසානයේ පිරිනමා අවසන් කොට තිබුණු බැවින් එය 2022 වර්ෂයට අදාළ උපචිත වියදමක් ලෙස සලකා ඇත. | |
| (ඊ) | එකතු කළ අගය මත බදු පාලන ගිණුමටහර කළ යුතු රු. 576,381 ක් එම ගිණුමට හර නොකර වෙනත් ආදායම් ගිණුමකට හර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වගකීම් සහ ආදායම් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වෙමු. | ගිණුම් තැබීම නිවැරදිව කළ යුතුය. |
| (උ) | එකතු කළ අගය මත බදුලෙස ගිණුම්ගත කළ යුතු රු. 2,606,452 ක මුදලක් වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා බදු වගකීම වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වෙමු. | ගිණුම් තැබීම නිවැරදිව කළ යුතුය. |
| (ඌ) | ගමට සන්නිවේදනය ව්‍යාපෘතියට ගිණුම්ගත කළ යුතු රු. 487,500 ක වියදමක් විවිධ මෙහෙයුම් පිරිවැය ගිණුමට හරකර තිබුණි. | එකඟ වෙමු. | ගිණුම් තැබීම නිවැරදිව කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු. 3,815,600 ක සෙස් බදු ආදායම 2023 අප්‍රේල් 26 දින ලැබී තිබුණද එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 3,815,600 ක් අඩුවෙන්ද ලැබිය යුතු ආදායම (වත්කම්) රු. 3,815,600 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආස්ක් කේබල් විෂන් පුද්ගලික සමාගම විසින් ගෙවන ලද සෙස් ගාස්තු රු. 3,815,600 ක මුදල ගෙවා තිබුණේ 2023 අප්‍රේල් 26 දිනය. නමුත් 2023 අප්‍රේල් 03 දින වන විට අවසන් ගිණුම් සකස් කර තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශවල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය සඳහා කොන්ත්‍රාත්තුව ආරම්භයේදී ගෙවන ලද රු. 20,344,564 ක මුදල, සමාලෝචිත වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන් අය කර තිබුණු නමුත් එම ගිණුමේ රු. 5,522,503 ක ශේෂයක් තවදුරටත් පැවතුණි. | එකඟ වෙමු. | කදිරාන අත්තිකාරම් ගිණුමේ ගිණුම් අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඔ) | වටිනාකම රු. 45,000,000 ක් වූ අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ක කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි | ඉඩමේ හිමිකම පිළිබඳ කටයුතු නිරාකරණය වූ පසුව ඉඩමප්‍රත්‍යාගණනය කොට මූල්‍ය | කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ අයිතිය |

| | | | |
|---|---|---|---|
| | ඉඩම් ප්‍රදේශයේ ආසන්න වශයෙන් සියයට 69 ක බිම් කොටසක් කටාන ප්‍රාදේශීය සභාව අත්පත් කරගෙන තිබුණද එම ඉඩමේ අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කරගෙන ඊට අදාළ ගැලපීම් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. | ප්‍රකාශනවලට ඇතුළත් කරන බව කරුණාවෙන් සලකන්න. | පිළිබඳ ගැටලු නිරාකරණය කරගත යුතුය. |
| (ඕ) | හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළ ඉඩම තක්සේරු කර2022 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මේ වන විටත් සියලුම ඉඩම් (කදිරාන හැර)ප්‍රත්‍යාගණනය කර ඇති අතර එම වටිනාකම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වීමටකටයුතු කරමු. | වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ක) | මූල්‍යප්‍රකාශනවල දැක්වෙන සටහන් අංක 3.5.1 හි දැක්වෙන ආදායම් බදු ගණනය කිරීමේ උප ලේඛනයේ සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභය රු. 31,697,157,371 ක් වුවද රු. 30,135,029,649 ක් පදනම් කරගෙන ආදායම් බදු ගණනය කර තිබුණි. එහිදී ලාභයෙන් අඩු කිරීමට ඉඩදිය හැකි වියදම් යටතේ පාරිතෝෂිත ගෙවීම් ලෙස රු. 1,720,250වෙනුවට රු. 1,055,330 ක් පමණක් අඩු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විනිමය අනුපාත වෙනස්වීම මත ඇති වූ රු. 4,565,034,242 ක හුවමාරු අලාභය ආදායම් බදු ගණනය කිරීමේදී ගැලපීම් කර නොතිබුණි. | එකඟ වෙමු. | ආදායම් බදු නිවැරදිව ගණනය කළ යුතුය. |

**1.5.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගෙන් රු. 373,198,897 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. ඒ තුළමුළු ණය ශේෂයවර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන ණයගැතියන් වශයෙන් වර්ගීකරණය කර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම ණය ශේෂය තුළ වර්ෂ 20 කට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂයන්ද ඇතුළත් වී තිබුණි. | එක්එක් ගනුදෙනුකරුවන් විසින් වැඩිපුර ගෙවූ මුදල්වල එකතුව රු. 2,123,490 ක් විය. එම මුදල ගලපා මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂය නිවැරදිව දක්වා ඇත. | නිවැරදි කාල විශ්ලේෂණයක් සහිතව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර වර්ෂයේ කොමිෂන් සභාවේ මූල්‍යප්‍රකාශන අනුව ගමට සන්නිවේදන ව්‍යාපෘතියට එම වර්ෂයේ දරා ඇති වියදමරු. 187,645 ක් විය. එම වියදම් | 2021 වර්ෂයේදී අදාළසියලුම වවුචර්පත් විගණනය සඳහා ඉදිරිපත්කර තිබූ අතර මෙම | පෙර වර්ෂයකට අදාළ තොරතුරක් සමාලෝචිත වර්ෂයේදීද, විගණනය |

| | | |
|---|---|---|
| හඳුනාගැනීම සඳහා විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වර්ෂයේදීද එම තොරතුරු/වවුචරපත් ඉදිරිපත් කළ හැකි බවකරුණාවෙන් සලකන්න. | විසින් ඉල්ලා ඇති අවස්ථාවකදී එම තොරතුරු විගණන කටයුතු නිම කර වාර්තාව එවීමට පෙර ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුළු ණයගැති ශේෂයෙන් සියයට 46 කට වැඩි ප්‍රමාණයක් පුද්ගලික සමාගමක් නමින් අයවිය යුතුව තිබුණු අතර එම මුදල රු. 174,800,000 ක් විය. 2007 වර්ෂයේ රු. 172,500,000 ක්ද 1993 වර්ෂයේ රු. 2,300,000 ක්ද ලෙස පැන නැගී තිබුණු මෙම හිඟ ණය ශේෂ සනාථ කර නොතිබුණු අතර අය කරගැනීමට ඵලදායී ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි. | එකඟ වෙමු. | අයවිය යුතු ණය මුදල් නොපමාව අයකර ගත යුතුය. |
| (ආ) | මුළු ණයගැති ශේෂයෙන් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව නමින් අයවිය යුතුව තිබුණු අතර එම මුදල රු. 145,254,449 ක් විය.එම ණය ශේෂය 1976 වර්ෂයේ සිට ආරම්භ වී තිබුණි. මෙම හිඟ ණය ශේෂ සනාථ කර නොතිබුණු අතර අය කරගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟ වෙමු. | අයවිය යුතු ණය මුදල් නොපමාව අයකර ගත යුතුය. |
| (ඇ) | ණයගැති ශේෂය තුළ වැඩියෙන් අයකර ගන්නා ලද සෘණ ණය ශේෂ 544 ක එකතුවක් වූ රු. 2,171,741ක් 2022 දෙසැම්බර් 31දින දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එම ණය ශේෂ තුළරු. 100ට අඩු ණයගැතියන් සංඛ්‍යාව 415ක් විය. මෙම ණය ශේෂ ගැලපීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍යක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙය නිරවුල් කිරීමට හැකියාවක් නැත. 2015 වර්ෂයේ සිට අදාළ මුදල් වලට වඩා වැඩියෙන් ගෙවනු ලැබූ අවස්ථා මේ මඟින් නිරූපණය වන අතර මෙම මුදල් ආදායමට ගැලපීමට හෝ වෙනත් විකල්පයක් සඳහා උපදෙස් ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි. | සෘණ ණය ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය ශේෂයෙන් රු. 344,832,696ක වටිනාකමැති ණය ශේෂ 104 ක් සනාථ කරගැනීම සඳහා ලිපි යවා තිබුණු නමුත් ශේෂ 03 ක තහවුරු කිරීම් ලිපි පමණක් ලැබී තිබුණි. කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 12,604,641 ක වටිනාකමැති ණය ශේෂ 1,057 ක් තහවුරු කිරීමට ශේෂ සනාථ | ගුවන් විදුලි සංස්ථාවේ එක් එක් සේවාව සඳහා සංඛ්‍යාත කළමනාකරණ අංශය හා මූල්‍ය අංශය වෙන වෙනම ලිපි ගොනු පවත්වා ගෙන යන බැවින් වෙන වෙනම ලිපි යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වාර්තාවේ ඡේදයට අදාළව පිළිතුරු එවිය යුතු අතර ණයගැති ශේෂ සනාථ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ ලිපි යවා නොතිබුණි. | | |
| (ඉ) | පුද්ගලික ආයතනයකින් 2014වර්ෂයේ සිට 2017වර්ෂය දක්වා කාලයට අදාළව ලැබිය යුතු විදුලි සංදේශ බදු ආදායම වූ රු. 6,358,657 ක් අයකර ගැනීමට නඩු පවරා තිබුණද 2022දෙසැම්බර් 31දින දක්වා අය කරගෙන නොතිබුණි. | නොගෙවූ විදුලි සංදේශ බදු අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව නීති අංශය කටයුතු කරගෙන යනු ලබයි. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට නොපමාව ක්‍රියා කළ යුතුය. |
| (ඊ) | ආයතනයකින් 2011වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළව ලද සෙස් බදු ආදායම්වලට අදාළ එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල වූ රු. 3,411,488ක් අයකර ගැනීමට නඩු පවරා තිබුණද එම මුදල අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. එසේම පුද්ගලික සමාගමකින් 2011හා 2012වර්ෂයන්ට අදාළව අයවිය යුතු සෙස් බදු ආදායම වූ රු. 254,13ක් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයවිය යුතු රු. 3,411,488 ක් වන සෙස් බදු ශේෂය අයකර ගැනීමටනීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව නීති අංශය මගින්කටයුතු කරමින් පවතී. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට නොපමාව ක්‍රියා කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් ලෝන්ග්ඩන් පෙදෙස ගොඩනැගිල්ල බද්දට ගැනීමේදී ගොඩනැගිල්ලේ හිමිකරු සමඟ එළඹි ගිවිසුමේ hවගන්තිය අනුව අදාළ බදු කාල සීමාව තුළ ගිවිසුම අවසන් කළ නොහැකි බවත්, අදාළ කාල සීමාව අවසන් වීමට කලින් බදු ගිවිසුම අවසන් කරන්නේ නම් ඉතිරි කාලසීමාව සඳහාද බදු කුලිය ගෙවිය යුතු බව දක්වා තිබුණි. බදු කාලය ඉක්මවීමට පෙර කොමිෂන් සභාව විසින් නැවත ගොඩනැගිල්ල ආපසු භාරදී තිබීම හේතුවෙන් බද්දට ගැනීමේදී ගෙවූ රු. 1,350,000 ක තැන්පතු මුදලට අමතරව ගිවිසුම අනුව ගෙවිය යුතු ඉතිරි ගොඩනැගිලි කුලී සහ හිමිකරු විසින් දන්වා තිබුණු හානි වෙනුවෙන් තවදුරටත් කොමිෂන් සභාව විසින් ගොඩනැගිල්ලේ හිමිකරුවෙතරු. 960,250 ක් ගෙවිය යුතු බවක් නිරීක්ෂණය විය. | අළුත්වැඩියාවන් සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන ඇස්තමේන්තුව ගිවිසුමේ xxxixවගන්තිය පරිදි වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු විසින් සහතික කළ යුතුවේ. ඒ අනුව නැවත ගෙවිය යුතු මුදල තීරණය කළ යුතු වේ. | කොමිෂන් සභාවට අවාසිදායක කොන්දේසි ඇතුළත් කර ඇති ලෝන්ග්ඩන් පෙදෙස ගොඩනැගිල්ලේ බදු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කළ යුතු අතර හිමිකරු විසින් දන්වා ඇති අලාභ හානි සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු. 505,355 ක නොපියවූ මිලදීගැනීම් අත්තිකාරම් ශේෂයක් විය. 2002 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා හිටපු සභාපතිවරයෙකු විසින් අවස්ථා 04 කදී රු. 116,000 ක අත්තිකාරම් ගෙන තිබුණු අතර එම අත්තිකාරම් ලබා ගත්තේ කුමන කාර්යයක් සඳහාද | මෙම නිලධාරියා කොමිෂන් සභා සාමාජිකයකු නොවන බැවින් පෞද්ගලික ලිපි ගොනු ආරම්භ කර නොමැත. | අත්තිකාරම් අදාළ කාල සීමාව තුළ පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

යන්න විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 10 ත් 11 ත් අතර කාලයක් ගතවී තිබියදී ඒවා පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 20 (2) (ඇ), 21 (2) (ආ) සහ 22 (2) (අ) | යම් ගාස්තුවක් ගෙවනු ලැබූ විට පමණක් සේවා සැපයිය යුතු වුවත් 2018 වර්ෂයට පෙර මුදල් ලැබීමට පෙර සේවා සැපයීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විටරු. 373,198,897 කමුදලක් අයවිය යුතුව පැවතුණි. | සේවා සැපයීමට පෙර බදු ඉන්වොයිස් පත්‍ර නිකුත් කිරීම නිසා, අයවිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත වී ඇත. | පනතේ විධිවිධානවලට අනුගත විය යුතුය. |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21(1) (ආ), 26(1) වගන්ති සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂයට අදාළඑකතු කළ අගය මත බදු පාලන ගිණුමට අනුව ගෙවූ බදු වටිනාකම රු. 1,785,458,237 ක් විය.කෙසේ වුවත් රු. 40,952,958 කමුදලක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි. | නිවැරදි ලෙස වර්ෂයේ සියලුම එකතු කළ අගය මත බදු ගෙවා ඇත. | එකතු කළ අගය මත බදු ගිණුමේ රු. 40,952,958 ක ශේෂයක් පවතින බැවින් බදු පනතේ 21(1) (ආ), 26(1) වගන්ති සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය--ට අනුගත විය යුතුය. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ යේආයතන සංග්‍රහය** | | | |
| | i. IIවැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය | විධිවිධානවලට අනුකූල නොවන ලෙසකොමිෂන් සභාව විසින් තනතුරු 07 ක් සඳහා දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පත්කිරීම් සිදු කර තිබුණු අතර එහි කාල පරාසය අවුරුදු 02 සිට අවුරුදු 15 ක් දක්වා විහිදී තිබුණි. නිලධාරීන් 07 දෙනෙකුට වැඩ බැලීම වෙනුවෙන් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස රු. | පත්කිරීම් රීති කාණ්ඩයෙන් ආවරණය වන කරුනු සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වීම් 2013 සැප්තැම්බර් 01 දින සිට අවසන් වන බව එම රීති හඳුන්වා දීමේදී කොමිෂන් සභාව තීරණය කර ඇත. මෙම වැඩ බැලීමේ පත්වීම් ලබා දීම එකී රීති කාණ්ඩයේ ප්‍රතිපාදන හා එකග වේ. | පත් කිරීම් රීති කාණ්ඩය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු--වෙන් අනුමැතිය ලබාගත යුතුය. වැඩ බැලීමේ පත්වීම් ලබාදී ඇතිතනතුරු අත්‍යාවශ්‍ය නොවන්නේ නම් තනතුරු සංඛ්‍යාව |

| | | | | |
|---|---|---|---|---|
| | | 19,647,854 ක් ගෙවා තිබුණි. 2022 වර්ෂය තුළ පමණක් රු. 7,075,398 ක් ගෙවා තිබුණි. | | සංශෝධනය කළ යුතුය. |
| | ii. XII පරිච්ඡේදයේ 16.5 වගන්තිය | විධිවිධාන ප්‍රකාරව 2010 සැප්තැම්බර් 02 දින සිට 2015 සැප්තැම්බර් 08 දින දක්වා විදේශ රැකියාවකට යාමට වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණු නිලධාරියෙකු 2015 සැප්තැම්බර් 09 දින සිට සේවයට වාර්තා කර නොතිබුණි. එදින සිට 2022 පෙබරවාරි 09 දින දක්වා වර්ෂ 07 කට ආසන්න කාලයක් ගතවී තිබියදී රු. 1,878,060 ක ඇප බැඳුම්කර වටිනාකම ආපසු ගෙවන මෙන් ඔහු වෙත කොමිෂන් සභාව විසින් ලිපියකින් හෝ දන්වා නොතිබුණි. ඒ හේතුවෙන් අයවිය යුතුරු. 1,878,060 ක මුදල 2022 දෙසැම්බර් 31 දින දක්වා අය කරගෙන නොතිබුණි. | 2015 සැප්තැම්බර් 09 දින නැවත කොමිෂන් සභාවේ සේවයට වාර්තා කළ යුතු වුවද වාර්තා කර නොතිබුණි. නිලධාරියා වෙත ගෙවිය යුතු දණ්ඩන මුදල සම්බන්ධව 2022 වර්ෂයේ ලිපියක් යවා ඇතත් පදිංචිය හැර ගොස් ඇති බව දන්වමින් එම ලිපිය නැවත ආපසු ලැබී ඇත. ඉන්පසු 2022 මාර්තු 14 දිනමීගමුව ප්‍රාදේශීය ලේකම් වෙතස්ථිර පදිංචි ලිපිනය සනාථ කර එවන ලෙස දැන්වුවද පිළිතුරු ලැබී නොමැත. එයට සිහි කැඳවීමක් 2022 මැයි 04 දින යවා ඇත. | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16.5 වගන්තියප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | i. මුදල් රෙගුලාසි 138 | විධිවිධානවලට පටහැනිව නාමමාත්‍ර ඉන්වොයිස් පත්‍ර 03 ක් පදනම් කරගෙන ගෙවීම් වවුචර් 03 කට රු. 1,075,000 ක් ක් ගෙවා තිබුණි. | පසු අවස්ථාවකදී එම වියදමනැවත සිදු වී නැති බව සහතික කරමු. තවද මෙවැනි තත්වයන් ඉදිරියේදී සිදු නොවීමටඅවශ්‍ය පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි 261(3) | මහජන බැංකු ශේෂ සනාථ කිරීමේ ලිපියට අනුව රු. 436,243,821 ක ශේෂයක් තිබුණද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. 234,834,591 ක ඍණ ශේෂයක් විය. එම බැංකු ගිණුමට අදාළව ඉදිරිපත් | 2022 ජනවාරි 01 දිනට මහජන බැංකු ගිණුමේ අදාළශේෂයරු. 933,237,468 ක ඍණ අගයක් ගැනීමට හේතු වුයේ,නෙලුම් කුලුනේ ණය වාරිකය - ඩොලර්4,919,373 (රු.1,028,595,896) සහ | මුදල් රෙගුලාසි 261(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් ලැබීම් රු. 260,619,617 ක් විය. උක්ත බැංකු ගිණුමේ ආරම්භක ශේෂය රු. 933,237,468 ක සෘණ ශේෂයක්ව පැවතියදී මුදල් රෙගුලාසිවලට පටහැනිව චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ අසාමාන්‍ය තත්ත්වය විගණනයට ප්‍රශ්නගත විය. | එල්.එස්.ටෙලිකොම් ආයතනයට මෘදුකාංග නඩත්තුව සඳහා යුරෝ 25,116.75 ක් (රු.6,292,348) ගෙවීම සඳහා බැංකුව වෙත අණකර ලබාදී තිබූ හෙයිනි. | |
| iii.2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) | විධිවිධානවලට පටහැනිව කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ රු. 100,000 සීමාව ඉක්මවා අවස්ථා 13 කදී එකතු වටිනාකම රු. 3,222,168 ක් මිලදීගැනීම් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. | 2022 වර්ෂයේ රටෙහි පැවති උග්‍ර ඉන්ධන අර්බුදය හමුවේ අත්‍යාවශ්‍යරාජකාරී පවත්වා ගැනීම සඳහා රාජකාරී වාහන යොදාගැනීමේදී, ආයතනයේ විදුලිජනක යන්ත්‍රයට අවශ්‍ය ඉන්ධන සපයා ගැනීමේදී,ඉන්ධන සැපයුම්කරු අත්පිටමුදලටපමණක්ඉන්ධනසපයනබවටකළලිඛිතදැනුම්දීම නිසා මෙලෙසමුදල්අත්තිකාරම්මගින්ඉන්ධනමිලදීගැනීමසිදුවිය. මෙහිදීකොමිෂන්සභාවේමුදල්අත්තිකාරම්සඳහාවූචක්‍රලේඛඅනුවරු.100,000 ටවැඩිමුදල්අත්තිකාරම්අධ්‍යක්ෂජනරාල්වරයාගේඅනුමැතියමතසිදුවිය. | අදාළ චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iv.මුදල් රෙගුලාසි අංක 1645(ආ) | විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාවේ වාහන 25 න් වාහන 08 ක 2022 වර්ෂයේ කිසිඳු මාසයක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. වාහන 13 ක සමාලෝචිත වර්ෂයේ මාස කීපයක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී එම සියලු ධාවන සටහන් ලබා දීමට කටයුතු කරනු ලැබේ | මුදල් රෙගුලාසි 1645(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| v. මුදල් රෙගුලාසි අංක 1646 | විධිවිධාන ප්‍රකාරව 2022 වර්ෂයේ කොමිෂන් සභාවට අයත් වාහන 08 ක ගමන් පිළිබඳ මාසික සාරාංශයේ | ඉදිරියේදී එම සියලු ධාවන සටහන් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මුල් පිටපත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඉ) | 2022 අගෝස්තු 22 දිනැති අංකPED 2022/05දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.9 වගන්තිය | කොමිෂන් සභාවේ සේවය කරමින් සිට සමාලෝචිත වර්ෂයේදී විදේශගත වූ නිලධාරීන් 04 දෙනා වෙනුවෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම නිලධාරින්ට චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කරන ලෙස දැනුම්දී ඇත. ඔවුන් එලෙස කටයුතු නොකළහොත් එවැනි අවස්ථා සම්බන්ධව දක්වා ඇති චක්‍රලේඛයේ 3.14 වගන්තිය අනුව සේවයට වාර්තා කිරීමෙන් පසුව සලකා බලනු ලැබේ. | 2022 අගෝස්තු 22 දිනැති අංක PED 2022/05දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.9 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 31,697,157,371 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 32,296,276,914 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිපලයෙහි රු. 599,140,543 ක අඩුවීමක් පවතින බව නිරීක්ෂණය විය. මෙම අඩුවීමට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී නියාමන වියදම් වැඩිවීම, පරිපාලන හා ආයතන වියදම් වැඩිවීම හා විදේශ විනිමය ගනුදෙනුවල පාඩු වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

කොමිෂන් සභාවේ ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(අ) 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී දුරකථන කෙටි පණිවිඩ සේවා බදු ආදායම සියයට 42 කින්අඩු වීම ආදායම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබිණි.

(ආ) කොමිෂන් සභාවේ මුළු වියදම රු. 6,717,470,760 න් පරිපාලන හා ආයතන වියදම් සඳහා රු. 1,822,878,544 ක් හෙවත් සියයට 27 ක් වැයකර තිබුණු අතර කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු. 436,406,523 ක් හෙවත් සියයට 24 ක් ඒ තුළ ඇතුළත් වී තිබුණි. එසේ වුවද ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන විදුලි සංදේශ නියාමනය සඳහා මුළු වියදමෙන් රු. 209,596,429 ක් හෙවත් සියයට 03 ක් පමණක් වැයකර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභා තීරණ අනුව කොළඹ නෙලුම් කුලුන වාණිජකරණය කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල දීමනා හා දුරකථන ගාස්තු ලෙස ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත | එකඟ වේ. | කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ සමාගමෙන් අයවිය යුතු මුදල් අය |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ පිළිවෙලින් රු. 27,763,292 ක් හා රු. 2,106,560 ක වියදමක් දරා තිබුණද කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමෙන් එම මුදල 2023 ජුනි 30 දින දක්වා අය කරගෙන නොතිබුණි. | | කරගත යුතුය. |
| (ආ) | 1999 හා 2010 වර්ෂවලදී හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි පර්චස් 6.21 ක ඉඩමේ අයිතිය පවරාගැනීම සඳහා එහි තක්සේරු වටිනාකම හා වෙනත් වියදම් සඳහා රු. 345,502 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එහි අයිතිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පවරාගෙන නොතිබුණි. තවද ප්‍රධාන කාර්යාලය හා කොකාවිල් බහුකාර්යය මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වල හිමිකම් ඔප්පු / බදු ගිවිසුම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ලබාගෙන නොතිබුණි. | ජාතික නිවාස සංවර්ධන අධිකාරියවිසින් එහිපනත අනුව නේවාසික අරමුණින් බැහැරවඉඩම් සින්නක්කර පදනමින් ලබා දිය නොහැකි බව 2022 සැප්තැම්බර් 01 දින දන්වා ඇති අතරඒ අනුව හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටිඉඩමේ අයිතිය දිගුකාලීන බදු පදනම මත ලබා ගැනීමට අවශ්‍ය කටයුතුසිදු කරමින් පවතී. අදාළ බිම් කොටස සඳහා ගෙවන ලද මුදල් ඉඩම භාර දුන් දින සිටමේ දක්වා හිඟ බදු මුදලට හිලව් කිරීමට කටයුතු කළ හැකි බව ජාතික නිවාසසංවර්ධන අධිකාරිය මඟින් දන්වා ඇත.<br>කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමවිශේෂ ප්‍රදාන පත්‍රයක් යටතේ ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක්ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද අතර තාක්ෂණ විෂයභාර අමාත්‍යවරයා විසින් එමඅමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත.<br>කොකාවිල් බහු කාර්ය සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය පිහිටි භූමියේ නීත්‍යානුකූලහිමිකාරීත්වය ලබා ගැනීමට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඉඩම්කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සමග කටයුතු කරමින් පවතී. | වත්කම් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂිත වශයෙන් වෙන් කළ රු. 117,674,290 ක මුදලින් රු. 72,420,000 ක මුදලක් ආයෝජනය කර තිබුණද ඉතිරි රු. 45,254,290 ක මුදල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | එකග වේ. ඉදිරි මූල්‍ය වර්ෂයේදී පාරිතෝෂික වෙන් කිරීම් මුදලම ස්ථාවර තැන්පතු වල ආයෝජනයකරන බව කාරුණිකව දන්වා සිටිමු. | පාරිතෝෂිත වශයෙන් වෙන් කළ මුදල ආයෝජනය කළ යුතුය. |
| (ඈ) | සාමාජිකත්වය ලබාගත් වෘත්තීය ආයතනවලින් සාමාජික මුදල් ගෙවන ලෙස දන්වාලිඛිත ඉල්ලීමක් හා මුදල් ලබාගත් බවට අදාළ වෘත්තීය ආයතනවලින් නිල ලදුපතක් | මින් ඉදිරියේදී සාමාජික ගාස්තු ගෙවන ලෙසට අදාළ වෘත්තීය ආයතන වෙතින් නිලධාරීන් වෙත නිකුත් කරනලද දැනුම් දීම් ලිපි, ප්‍රතිපූර්ණ කටයුතු සඳහා උපයෝගී කරගතයුතු අනිවාර්ය ලේඛනයක් ලෙස | සාමාජික මුදල් ගෙවීමට වෘත්තීය ආයතනවලින්එවූ ලිපි ඉදිරිපත් කළ යුතු බව |

| | | |
|---|---|---|
| නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 27 කටරු. 452,647 ක මුදලක් සාමාජික මුදල් ලෙස ප්‍රතිපූර්ණය කර තිබුණි. | සලකාකටයුතු කරන බව දැනුම් දෙමු. | නිලධාරීන්ට දැන්විය යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම** | | |
| (i) | මෙම ඉදිකිරීම සඳහා කොමිෂන් සභාව සහ කොන්ත්‍රාත්කරු සමඟ 2014 ජූලි 28 දින එළඹුණු ගිවිසුම කොමිෂන් සභාව විසින් ආයෝජන මණ්ඩලයේ හා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් මත 2016 අගෝස්තු 10 දින අවසන් කර තිබුණි. එම තීරණයට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලට අනුව කොන්ත්‍රාත්කරුට වන්දි ඇතුලුව මුළු බේරුම්කරණ වියදම ලෙසරු.426,897,598 ක මුදලක්කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | ඉදිකිරීම් සැලසුම් කිරීමට ප්‍රථම අදාළ ආයතනවලින් අනුමැතිය ලබාගත යුතුය. |
| (ii) | කොන්ත්‍රාත්තුව නිම කරන දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 33 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට දරන ලද රු.711,608,769 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | ගිණුම් අඩුපාඩු නිවැරදි කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ගමට සන්නිවේදන ජාතික ව්‍යාපෘතිය** "ගමට සන්නිවේදනය"ජාතිකව්‍යාපෘතියසඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ තනතුරු 04ක් සහ ව්‍යාපෘතිසහායක තනතුරු 15ක් බඳවාගැනීම සඳහා 2021නොවැම්බර් 05දින දැන්වීම් පලකර තිබුණි. යථෝක්ත තනතුරු | එකඟ වේ. | "ගමට සන්නිවේදනය"ජාතිකව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |

සඳහා පිළිවෙලින් අයදුම්පත්‍ර204ක්ද,271ක්ද වශයෙන් අයදුම්පත් 475ක් ලැබී තිබුණු අතරරු.975,000 ක් වැයකර තෝරාගැනීමේ විභාගය 2022 ජුනි 22දින පවත්වා තිබුණි.යථෝක්ත තනතුරු සඳහා පිළිවෙලින් ලකුණු 40 ට වැඩිලකුණු ලබාගත් සංඛ්‍යාව66 ක්,74 ක් සිටියද විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා 2023 ජුනි 30 දින දක්වා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ගමට සන්නිවේදන ව්‍යාපෘතියට දරන වියදම් සහ වත්කම් වෙනම හඳුනාගත හැකිවන පරිදි ගිණුම්ගත කර නොතිබුණි.

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම** | | |
| (i) | මෙම කාර්යය සඳහා එකතු කළ අගය මත බදු රහිත වටිනාකම රු. 139,882,281 කට පෞද්ගලික ආයතනයක් වෙත 2019 ජනවාරි 31 දින ප්‍රදානය කර තිබුණු අතර ප්‍රමාණ බිල්පතේ ඇතුළත් නොවූ විචලතාවයන් හා අමතර වැඩ සඳහා රු.24,360,085 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි | නිරීක්ෂණය නිවැරදි වේ. | ඇස්තමේන්තු නිසි පරිදි සකස් කළ යුතුය. |
| (ii) | උක්ත කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 11 දින නිම කළ යුතු වුවද 2023 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර නොතිබුණු අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීම.** | | |
| | කොන්ත්‍රාත් වටිනාකම රු. 209,093,034 ක් වූ ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2020 පෙබරවාරි 15 දින අවසන් කළ යුතු වුවද 2023 ජුනි 30 දින වන | මෙම ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අවශ්‍ය බව තීරණය කිරීම නිසා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටරේඛීයඅමාත්‍යාංශයට අවශ්‍ය ලිපි ලේඛන ලබාදීඇත. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනෙන් පසු කිසිදු භෞතික ප්‍රගතියක් නොතිබුණි.2019 ජුනි 10 දින උපදේශන සේවා සැපයීම වෙනුවෙන් මොරටුව විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට උපදේශක සේවා ගාස්තු ලෙස මුළු උපදේශන සේවා ගාස්තුවලින් සියයට 70 ක් එනම් රු. 7,318,256 ක් මොරටුව විශ්ව විද්‍යාලය වෙත ගෙවා තිබුණි. | | |
| (ඇ) | කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍ර ඇස්තමේන්තු සකස් කිරීමේ කාර්යයන් සඳහා උපදේශක ගාස්තුව ලෙස 2015 ජනවාරි 25 දින මොරටුව විශ්ව විද්‍යාලයට රු. 10,057,910 ක් ගෙවා තිබුණු අතර එම වියදම කෙරීගෙන යන වැඩ ගිණුමේ ගිණුම්ගත කර තිබුණද 2022 ජුනි 30 දින දක්වා ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදුකර නොතිබුණි. | නිරීක්ෂණයනිවැරදි වේ. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | **ජාල අංශය සඳහා තාක්ෂණික උපකරණ සැපයීම, සවිකිරීම සහ ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය.** | | |
| (i) | ජාතික තරඟකාරී ක්‍රමය යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු. 6,450,000ක්වූ තාක්ෂණික උපකරණ වර්ග 03ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණද රු. 1,047,000 කට එක් තාක්ෂණික උපකරණයක් වූ ක්ලැම් ඔන් අර්ත් ටෙස්ටර් 03ක් පමණක් පුද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. අනෙක් තාක්ෂණික උපකරණවල අවශ්‍යතාවය නොතිබුණේද යන්නත් එම උපකරණ නොතිබීමෙන් අදාළ කාර්යය ඉටු කිරීමේ ඵලදායීතාව පිළිබඳවත් විගණනයට ප්‍රශ්නගත විය. | මෙහි සඳහන් කර ඇති උපකරණ වර්ග 03 න්එක්උපකරණයක් සඳහා එක් ආයතනයක් පමණක් මිලගණන්ඉදිරිපත් කර තිබුණද, තාක්ෂණික කමිටුව විසින් එම ලංසුව තෝරානොමැත. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම උපකරණය සඳහා නැවතමිලගණන් කැඳවීම සඳහා උපදෙස් දී ඇති නමුත් 2021 වර්ෂයේ ඇති වූ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් 2021වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට අනුකූලවප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට නොහැක. එම වර්ෂය තුළ නැවත මිලගණන් කැඳවීම සඳහා කාලය ප්‍රමාණවත් නොවූ අතර 2022වර්ෂය සඳහා මෙමඋපකරණ මිලදී ගැනීමට අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර නොමැත.<br><br>මෙහි සඳහන් කර ඇති තවත් උපකරණ | අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සැපයීම සඳහා එක් ආයතනයක් පමණක් මිලගණන් ඉදිරිපත්කර ඇත. එම ආයතනයෙන් මෙම උපකරණ මිලදී ගැනීමට තාක්ෂණික කමිටුවනිර්දේශ කර ඇති නමුත් එම ආයතනය සමග කොමිෂන් සභාව එළඹ ඇති වෙනත් නඩත්තු ගිවිසුමක් සම්බන්ධව ඇති වූගැටලුවක් හේතුවෙන් විමර්ශනයක් සිදු කෙරෙමින් පැවතිණි. ඒ නිසා ඉහත කීඋපකරණ සම්බන්ධ ලංසු ප්‍රදානය එම ආයතනයට ලබා නොදීමටත්, ඉන්දියාවේපිහිටි අදාළ උපකරණ වල කලාපීය නියෝජිත ආයතනය වෙතින්සෘජුවම මිලදි ගැනීමටත් ඇති හැකියාව විමසා බැලීමට ජොෂ්ඨ ප්‍රසම්පාදනකමිටුව තීරණය කර ඇත. ඒ අනුව අදාළ ආයතනයෙන් මේ පිලිබඳව විමසාඇතත් ඒ සඳහා ප්‍රතිචාරයක් ලැබී නැත. | |
| (ii) | ටවර් හයිට් මෙෂරින්ග් ලේසර් මීටර්03ක් සඳහා එක් ආයතනයක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු බැවින් නැවත ලංසු කැඳවීමටත්, රේඩියේෂන් මීටර් ඇන්ටනා 02ක් සඳහා ලංසු එක් ආයතනයක් පමණක් ඉදිරිපත් කර තිබුණු බැවින් ඒ සඳහා ඉන්දියාවේ ප්‍රාදේශීය නියෝජිත ආයතනය මගින් සෘජුවම මිලදී ගැනීමටත් සහ වෙනත් දේශීය නියෝජිතයන් සිටීද යන්න සොයා බැලීමටත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන කමිටුවට උපදෙස් දී තිබුණද ප්‍රසම්පාදන කමිටුවඑම උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි. ලංසු ලේඛන ප්‍රකාරව 2022 අප්‍රේල් 02 දින සිට සති 04ක් ඇතුළත අදාළ උපකරණ සවිකිරීම සිදුකළ යුතු වුවද 2022 අගෝස්තු 30 දින සවිකර තිබුණි. | ඉන්දියාවේ පිහිටි ප්‍රාදේශීය නියෝජිත ආයතනය වෙතින් විමසාඇතත් ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාරයක් දක්වා නැත.කොමිෂන් සභාව විසින් රොටෙක්ස්පුද්ගලික සමාගම වෙත 2022 ජනවාරි 24 දින ලංසු ප්‍රදානය කළදලංසු කොන්දේසි අනුව සති 04 ක් ඇතුළත එම උපකරණ ලබාදිය යුතුව තිබිණි.නමුත්, එම කාලසීමාව තුළ රජය විසින් පනවා තිබූ අපනයන සීමා කිරීම සහබැංකු මගින් විදේශ මිලදී ගැනීම් සඳහා ඩොලර් ලබා දීම සීමාකිරීම හේතුවෙන් ඉහත කී ආයතනය විසින් | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | **අයි.බී.එම්. සර්වර් 11 ක් සඳහා වාර්ෂික නඩත්තු ගිවිසුම්වලට එළඹීමේ ප්‍රසම්පාදනය.** | | |
| (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 5.4.8(ආ)දරන මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණය 2022 අප්‍රේල් 27 දින සිට 2022 ජුනි 27 දින දක්වා වලංගු විය යුතු වුවත් තෝරාගත් ආයතනය විසින් ඉදිරිපත් | පිළිගනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 5.4.8(ආ)දරන මාර්ගෝපදේශයප්‍රකාරවකටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | කර ඇති කාර්ය සාධන සුරක්ෂණය 2022 මැයි 27 දින දක්වා පමණක් වලංගු වී තිබුණි. | | යුතුය. |
| (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 8.9දරන මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කිරීමත් සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් 2022අප්‍රේල් 07 දින ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර 2022 ජුනි 21දින කොන්ත්‍රාත් ගිවිසුම ලියා අත්සන් කර තිබුණි. | 2022 වර්ෂයේ මාර්තු මස සිට ජුනි මස දක්වා රටේ පැවති ප්‍රවාහන හා ඉන්ධන ගැටළු හේතුවෙන් ආයතනික කටයුතු Roster ක්‍රමයට ක්‍රියාත්මක වීම හේතුවෙන් නියමිත දිනට ගිවිසුම අත්සන් කිරීමට නොහැකි විය. මේ වනවිට රට සාමාන්‍ය තත්ත්වයට පත්ව ඇති බැවින් ඉදිරියේදී මෙවැනි තත්වයන් වලක්වා ගැනීමට පියවර ගනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 8.9දරන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතිය** | | |
| (i) | මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා අරමුදල් සපයා ගැනීමට 2012 සැප්තැම්බර් 17 දින කොමිෂන් සභාව විසින්චීන එක්සිම් බැංකුව සමඟ එළඹි ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් ඇ.ඩො. මිලියන 88.655 පමණක් ලබා දීමට එකඟ වී තිබුණ අතර 2016 අගෝස්තු 18දින වන විට ණය මුදල ලබාගෙන අවසන් කළ යුතුව තිබුණි. කොන්ත්‍රාත්තුවට අදාළ කාලසටහනට අනුව ඉදිකිරීම නිම නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ණය මුදල නියමිත පරිදි ලබාගැනීමට නොහැකිවී තිබුණු අතර අදාළ කාලය තුළදී ඇ.ඩො. මිලියන 67.260 ක් එනම් ණය මුදලින් සියයට 76 ක් පමණක් ලැබී තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | කොන්ත්‍රාත්තුව අදාළ කාලසටහනට අනුව ඉදිකිරීම සිදු නොකළ නිලධාරීන් හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුමේ 18.4 වගන්තිය ප්‍රකාරව වලංගු කාර්යය සාධන බැඳුම්කරයක්, රඳවා ගැනීමේ සහතිකයක් හා වෘත්තීය වන්දි රක්ෂණාවරණයක් ඉදිරිපත් කිරීමට චයිනා නැෂනල් ඉලෙක්ට්‍රොනික්ස් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් සමාගම අපොහොසත් වී තිබුණි. | නිරීක්ෂණයනිවැරදි වේ. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමේ 18.4 වගන්තියේ දැක්වෙන බැඳීම් ඉටුකරන තෙක් ද්‍රවශීලතා හානි ලෙස අඩුකර ඇති ඇ.ඩො. මිලියන 10.43 ක මුදල සහ ගැලපුම්ගත කොන්ත්‍රාත් වටිනාකමින් ඉතිරි මුදල වූ ඇ.ඩො. මිලියන 4.115 ක මුදල රඳවා ගැනීම සිදුකර තිබුණි. | | |
| (iii) | ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වනවිට රු. මිලියන 12,762 ක ණය වාරික හා පොලී කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි. | ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව විදුලි සංදේශ හා විකාශන කටයුතුවලින් දආදායම් ඉපයිය යුතුය. එනමුත් ජනමාධ්‍ය අමාත්‍යාංශය මූලිකව දැනට ආරම්භ කර ඇති, අංකිත විකාශන කිරීමේ ව්‍යාපෘතිය ප්‍රමාද වීම නිසා එම විකාශන කටයුතු සඳහා වෙන්කර ඇති යටිතල පහසුකම්වලින් ආදායම් ඉපයීම තවදුරටත් ප්‍රමාද වේ.අංකිත රූපවාහිනී සේවා ආරම්භ කිරීම ප්රමාද වීම නිසා මුදල් ගෙවා ලබා ගත යුතු වෙනත් අංකිත රූපවාහිනී සේවා සඳහා තරංග මාලා වෙන් කිරීම තවදුරටත් ප්‍රමාද වේ. | ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවිය යුතුය. |
| (iv) | කොළඹ නෙලුම් කුලුන මුළුතැන්ගෙයි උපකරණ භෞතික පරීක්ෂාවේදී පිරිවැය ඇ.ඩො. 15,747 ක් වූ අයිස් කැට සාදන යන්ත්‍රය (S/N G01423B) ක්‍රියාත්මක කළ නොහැකි මට්ටමේ පැවතුණු අතර ඇ.ඩො. 100,744 ක් පිරිවැය වූ අයිතම 32 ක ඌනතාවයක් විය. | මේ වන විට කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතියේ ඉංජිනේරු වන මොරටුව විශ්ව විද්‍යාලය වෙත මුළුතැන්ගෙයි උපකරණ පිළිබඳ ඇදීම් ලබාදී ඇති අතර එය කොමිෂන් සභාවට භාරදී ඇති මුළුතැන්ගෙයි උපකරණ ලැයිස්තුව සමඟ සැසඳීම ව්‍යාපෘතියේ ඉංජිනේරුවරු විසින් ආරම්භ කර ඇත. ව්‍යාපෘතියේ ඉංජිනේරු වන මොරටුව විශ්ව විද්‍යාලය එය සහතික කළ පසු තොරතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) | 2010 ඔක්තෝබර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව රූපවාහිනී, විදුලි සංදේශ හා ගුවන් විකාශන සේවා කටයුතු සඳහා කුලුන යොදා ගැනීම මූලික අරමුණ වී තිබුණු අතර එම කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | 2010 ඔක්තෝබර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ක්‍රියා කළ යුතුය. |
| (vi) | 2022 පෙබරවාරි 24 දිනැති අංක 2k22.286.06(1) දරන කොමිෂන් සභා තීරණය ප්‍රකාරව සියලු උපකරණ හා පද්ධතිවල නඩත්තු කටයුතු සඳහා ගිවිසුම්වලට එළඹීම කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම | මේ පිළිබඳව නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම වෙතට සිහිකැඳවීම් යොමුකර ඇත. නඩත්තු ගිවිසුම් ලැබුණු පසු ඒවා ලබා දීමට කටයුතු කරමු. | කොළඹ නෙලුම් කුලුන කොමිෂන් සභාවේ වත්කමක් බැවින් එහි නඩත්තු කටයුතු වෙනුවෙන් ගිවිසුම්වලට එළඹිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සතු වගකීමක් බව සඳහන් වී තිබුණි. එසේ වුවද 2022 පෙබරවාරි 28 දින සිට 2022 මැයි 28 දින දක්වා මාස 03 ක කාලයක් සඳහා කොමිෂන් සභාව විසින් නඩත්තු කටයුතු කොන්ත්‍රාත් සමාගම වූ සී.ඊ.අයි.ඊ.සී. සමාගම වෙතින් ඉවුකරගෙන තිබුණද 2023 මාර්තු 02 දින වන විටත් නඩත්තු කටයුතු වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | | |
| (vii) | කොළඹ නෙලුම් කුලුන කොමිෂන් සභාවට පවරා ගැනීමට කොමිෂන් සභාව වෙනුවෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය පත් කර තිබුණු අතර වටිනාකම රු. 22,500,000 කට ගිවිසුම් ගතවී තිබුණි. නමුත් නියමිත දිනට කාර්යය නිම කිරීමට නොහැකි වීම නිසා එම ගිවිසුම්ගත මුදල ඉක්මවා රු. 9,234,000 ක් ගෙවීම් කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදිවේ. ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදුකර ඇත. | කොන්ත්‍රාත්තු ගිවිසුම් ප්‍රකාරව නිම කළ යුතුය. |
| (viii) | කොළඹනෙලුම් කුලුන ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ගෙවූ උපදේශන ගාස්තුව රු.මිලියන 336.4 ක් වූ අතර ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා ගෙවූ මුදල රු. මිලියන 137.7 ක් විය. | කොන්ත්‍රාත්කරු විටින් විට ලබාදුන් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ ඉලක්කවලට අනුව ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයාගේ කාර්යභාරය ඉටුකිරිමට ලබාදුන් කාලය දීර්ඝ කරන ලදී. මේ වනවිට ව්‍යාපෘතිය අවසන්ව ඇති අතර අදාළ වියදම් ඇස්තමේන්තුගතකර අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකිරීමට කටයුතුකරඇත. තවද 2010 අමාත්‍ය මණ්ඩල අනුමැති ප්‍රකාරව ඇමරිකන් ඩොලර් මිලියන 02 ක් උපදේශන ගාස්තු හා වෙනත් අදාළ වියදම් ගෙවීම සඳහා අනුමැතිය ලබා දීඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ix) | කොළඹ නෙලුම් කුලුන වාණිජකරණය කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් උපදේශක වෙත 2020 පෙබරවාරි මාසයේ සිට 2022 පෙබරවාරි මාසය දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 5,227,613 ක් ගෙවා තිබුණද 2020 මැයි හා 2020 ජුනි මාස 02 සඳහා පමණක් මාසික වාර්තා ලබාදී තිබුණි. තත්කාර්ය පදනම මත බඳවා ගත් උපදේශක සහායකයින් 05 කගේ මාසික වාර්තා හා පැමිණීමේ | ඡේදයට අදාළ පිළිතුරු දක්වා නොතිබුණි. | උපදේශකගේ සහ උපදේශක සහායකයින්ගේ මාසික වාර්තා හා පැමිණීමේ හා පිටවීමේ මාසික වාර්තා ලබාගත යුතුය. |

හා පිටවීමේ මාසික වාර්තා සලකා බැලීමකින් තොරවවැටුප් හා දීමනා වශයෙන් රු.26,403,419 ක් ගෙවා තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 288 ක්වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 214 ක් විය. ඒ අනුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 77 ක් විය. මෙහි ඇතුළත් අතිරේක/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරා ල්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු 32 ක් සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. එසේම නිත්‍ය සේවක සංඛ්‍යාවේපුරප්පාඩු පිරවීමට කටයුතු නොකර ද්විතීයන හා කොන්ත්‍රාත්පදනම මත පිළිවෙලින් නිලධාරීන් 08 දෙනෙකු හා 02 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දින වන විට බඳවාගෙන තිබුණි. | චක්‍රලේඛ හා උපදෙස් මගින් වරින්වර සීමාකිරීම් නිසා බඳවාගැනීම සම්පූර්ණ කිරීමට නොහැකි විය .<br>එසේ වුවත් තාක්ෂණික ස්වරූපයේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව සහකාර අධ්‍යක්ෂ තනතුරු 19, කොමිෂන් සභා ලේකම් තනතුර, විදුලි සංදේශ නිලධාරි තනතුරු 07 සහ රියදුරු තනතුරු 11 පිරවීම සඳහා බදවා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත.<br>විගණන සහකාර තනතුරු 02 සඳහා බඳවාගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුඅනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.කොමිෂන් සභා පනත මගින් අනුමත කර ඇති කාර්යමණ්ඩලය සම්පාදනය කිරීමේ එක් ආකාරයක් වන ද්විතියන පදනම යටතේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොමිෂන් සභාව වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්යාල කාර්යය සහායක තනතුරු23 දෙනෙකු අනුමත කර තිබුණද කොමිෂන් සභාව විසින් කාර්යාල කාර්යය සහායකයින් 26 දෙනෙකු බඳවාගෙන තිබුණි. | විදුලි සංදේශ පනතේ 22 (ඇ) (1) (අ) වගන්තිය මගින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය තීරණය කිරීම කොමිෂන් සභාවට බලය ලබා දී ඇත. ඒ අනුව කොමිෂන්සභාව විසින් කාර්යාල සහයක තනතුරු 30 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත. ඒ අනුවඅනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බදවා ගැනීම් සිදු කර නැත. | අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතිරේක කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු--ව මගින් අනුමැතිය ලබාගෙන පමණක් බඳවාගත යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත නොවූ තනතුරක් වූ සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනම මත සහකාර ගණකාධිකාරීවරයෙකු පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 1,130,575 ක් ගෙවා තිබුණි. | නව බදවා ගැනීම් ක්‍රියාත්මක කිරීමේදී මෙම නිලධාරිනිය අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරකට අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාව සලකා බලනු ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු--ව අනුමත කළ සේවක සංඛ්‍යාව පමණක් බඳවාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරී තනතුරුවල අනුමත සේවක සංඛ්‍යාව 03 කින් වර්ධනය කරගෙන තිබුණි. | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය තීරණය කිරීම සඳහා විදුලි සංදේශපනතේ 22 (ඇ) (1) (අ) වගන්තිය මගින් කොමිෂන් සභාවට බලය ලබා දී ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතිරේක කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු--ව මගින් අනුමැතිය ලබාගෙන පමණක් බඳවාගත යුතුය. |
| (ඉ) | තෘතියික, ද්විතියික හා ප්‍රාථමික සේවා ගණයේ තනතුරු 08 ක් සඳහා පුරප්පාඩු 09 ක් වර්ෂ 02 සිට වර්ෂ 13 ක් වන කාල පරාසයක් තුළ පුරප්පාඩුව පැවතුණි. | ඉහත (අ)සඳහා ලබා දුන් පිළිතුර අදාළ වේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාවසංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | රාජ්‍යආයතනයකට රු. 2,992,332 ක මුදලක් ගෙවා බඳවාගැනීම් පරිපාටිය, සංවිධාන ව්‍යුහය, අනුමත සේවක සංඛ්‍යාව, කාර්යසාධන ඇගයීම් පද්ධතිය සහ වැටුප් ව්‍යුහය ඇතුලු කාර්යය පරිපාටිය සකස් කරගෙන තිබුණද එය කොමිෂන් සභා අනුමැතියට 2023 ජුනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | නව බඳවා ගැනීම් පටිපාටිය පිලිබඳව අධ්‍යයනය කරමින් පවතී. ඉන් අනතුරුව කොමිෂන් සභාවේඅනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | බඳවාගැනීම් පරිපාටිය සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබාගත යුතුය. |
| (උ) | 2022 වර්ෂයේ කළමනාකරණ සහකාර II(තාක්ෂණික නොවන)තනතුරට බඳවා ගත් නිලධාරීන් 04 ක සහ කාර්යාල කාර්යය සහායකගේ විභාග සහතික අදාළ ආයතනවලින් පරීක්ෂා කර නොතිබුණි. | මෙම විභාග සහතික පරික්ෂා කිරිම සඳහා අදාළ මුදල්ද ගෙවා2023 පෙබරවාරි 16 දින විභාගදෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | අදාළ ආයතනවලින්විභාග සහතික තහවුරු කරගත යුතුය. |
| (ඌ) | 2016 ජුලි 01 දින සිට කළමනාකරණ සහකාර II තාක්ෂණිකනොවන තනතුරට ද්විතියන පදනම මත බඳවාගත් කළමනාකරණ සහකාරවරිය 2021 ජුලි 01 දින ස්ථිර කර තිබුණද නිලධාරිනිය වෙත බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් තිබේද යන්න අදාළ ආයතනවලින් පරීක්ෂා කර නොතිබුණි. | නිලධාරිනිය අ.පො.ස. (සා.පෙල) විභාගයෙන් සම්මාන 05ක් සහිතව විෂයන් 07ක් සමත් වී ඇත. | අදාළ ආයතනවලින්විභාග සහතික තහවුරු කරගත යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළ ද්විතියන පදනම මත බඳවාගත් නිලධාරීන් 08 | එම25% දීමනාව රජයේ ඒකාබද්ධ අරමුදලට බැර වේ.කොමිෂන් සභාවේ බඳවාගනු ලබන | කොමිෂන් සභාවේ තනතුරු සඳහා |

| | | | |
|---|---|---|---|
| | ක් වෙනුවෙන් සියයට 25 ක විශ්‍රාම වැටුප් දායක මුදල වශයෙන් රු. 1,490,625 ක් ගෙවා තිබුණි. එය කොමිෂන් සභාවට අමතර වැය බරක් වූ අතර එම නිලධාරීන් බඳවා ගැනීමේදී බඳවා ගැනීමේ පරිපාටිය අනුව එක් එක් තනතුරට අදාළ සුදුසුකම් බඳවා ගත් නිලධාරීන්ට තිබේද යන්න අදාළ ආයතනවලින් පරීක්ෂා කර නොතිබුණි. | තනතුරු වලට සමාන්තර රජයේ සේවයේ තනතුරු දරන නිලධාරීන් ද්විතියන පදනම මත බඳවා ගනු ලැබේ. එම නිලධාරීන් රජයේ සේවයට බඳවා ගන්නා සුදුසුකම් කොමිෂන් සභාවේ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ සඳහන් බඳවාගැනීමේ සුදුසුකම් හා සමාන වේ. ඒ පිළිබඳව වෙනම සලකා බැලීමඅවශ්‍ය නොවන නමුත් නිලධාරින් බඳවා ගැනීමේදී ඉදිරිපත් කරනු ලබන දත්ත පත්‍රිකාවල දැක්වෙනඅදාළ සුදුසුකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්වේ. | ස්ථිර පදනමින් බඳවාගත යුතුය. |
| (ඒ) | කොමිෂන් සභාවේ පරිපාලන හා මානව සම්පත් අංශයේ ඉහළ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් තිදෙනාම ද්විතියන පදනම මත බඳවා ගත් නිලධාරීන් වූ අතර එම නිලධාරීන් විටින් විට සේවයෙන් ඉවත් වීමෙන් පරිපාලන හා මානව සම්පත් අංශයේ කටයුතු ඇනහිට තිබුණි. එම අංශයට වර්ෂ ගණනාවක සිට ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගෙන නොතිබුණි. | ද්විතියන පදනම් මත නිලධාරින් බඳවා ගැනීම හේතුවෙන් පාලන හා මානව සම්පත් අංශයේ කටයුතුඇනහිට නොමැත. එසේ ඇනහිට ඇති කටයුතු කවරේදැයි පෙන්වා දෙන්නේ නම් ඒ පිළිබඳව තොරතුරු ඉදිරිපත්කළහැකිය. | ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගත යුතුය. |
| (ඔ) | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාරවරියක් ද්විතියන පදනම මත කොමිෂන් සභාවේ සේවයට බඳවා ගැනීමේදී එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක රප්‍ර/ආ03/02/02/005 දරන 2021 නොවැම්බර් 23 දිනැති ලිපියේ 03 ඡේදය අනුව මෙම නිලධාරිනිය ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ රාජකාරී කළ කාලසීමාව තුළ වාහන අලුත්වැඩියා සහ වාහන ලිපිගොනු පවත්වාගෙන යාමේදී සිදු කර ඇතැයි පැවසෙන අක්‍රමිකතා සහ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නියෝග නොතකා ක්‍රියා කිරීම සම්බන්ධව විමර්ශනයක් පවතින බව දන්වා තිබියදී කොමිෂන් සභාවේ වගකිව යුතු නිලධාරීන් ඒ පිළිබඳව කිසිඳු අවධානයක් යොමු නොකර අක්‍රමිකතාවලට සම්බන්ධ නිලධාරිණියක් බඳවාගෙන තිබුණි. | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාව වෙත එච්.එම්.ඉරේෂා ශ්‍යාමලි මිය මුදාහැරියහැකි බව දක්වමින් එවා ඇති 2021 ජුනි 29 දිනැති ලිපියේ මෙවැනි විමර්ශනයක් පිළිබඳව සඳහන් කරනැත. එබැවින් එම ලිපියෙන් ලබාදුන් එකඟතාවය පදනම් කරගෙන පත්වීම් බලධාරියාගේ එකඟතාවය මතකොමිෂන් සභාව විසින් මෙම පත්වීම සිදුකරන ලදි.නිලධාරිනිය කොමිෂන් සභාව වෙත මුදාහැරීමඅනුමත කරමින් නිලධාරිනියගේ පත්වීම් බලධරයා හා විනය බලධරියාද වනජ්කාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති 2021 ඔක්තෝබර් 07 දිනැතිලිපියේද මෙවැනි කරුණක් සඳහන් නොවේ.විගණන විමසුමට පාදක වී ඇති 2021 නොවැම්බර් 23 දිනැති රජයේ ප්‍රවෘත්තිදෙපාර්තමේන්තුවේ ලිපියේ 03ඡේදයේ සඳහන්ව ඇත්තේ සිදුකිරීමට නියමිතවිමර්ශනයක් සම්බන්ධව වේ.ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ 13.1 වගන්තිය අනුව ද කොමිෂන් සභාවේ විනය රීති කාණ්ඩයේ 76 වගන්තිය අනුවද මූලික | ද්විතියන පදනම මත කොමිෂන් සභාවේ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේදී සේවය කරන ආයතනවලින් ඔවුන් පිළිබඳ විමසා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විමර්ශනයක් යනු කරුණු සොයා බැලීමේ පරීක්ෂණයක් වන අතර එමගින් නිලධාරියෙකු වරදකරුවකු බවට තීරණය නොවේ. මූලික විමර්ශනයෙන් අනතුරුව නිලධාරිනියට එරෙහිව චෝදනා නැගීමට තරම් ප්‍රමාණවත් කරුණු තිබෙන බව ඇයගේ විනය බලධාරියාට නිරීක්ෂණය වන්නේනම් වහාම පූර්ව තනතුරට කැඳවීමේ බලය ඇයගේ පූර්ව විනය බලධාරියා සතුවේ. මෙතෙක් එවැනි තත්ත්වයක් පිළිබඳව විනය බලධරියා විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දීමක් සිදුකර නැත. | |
| (ඕ) | 2002 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනමට කාර්යාල සහායක තනතුරට පත්කර තිබුණු නිලධාරියෙකු 2009 දෙසැම්බර් 02 දින සිට ලිපිකරු තනතුරට උසස් කර තිබුණි. බඳවාගැනීමෙන් වර්ෂ 05 කට පසු විභාග සහතික තහවුරු කර ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි. විභාග දෙපාර්තමේන්තුව විසින් එම සහතික ව්‍යාජ ප්‍රතිඵල සටහනක් බවට තහවුරු කර තිබුණි. 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේද ආයතන හා දණ්ඩ නීති සංග්‍රහය අනුව ව්‍යාජ ප්‍රතිඵල සටහනක් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවත් ඒ අනුව ඔහුට එරෙහිව විනයානුකූල සහ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන ඔහු වෙත දන්වා යවන ලෙසත් දක්වා තිබුණි.<br>විභාග දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් 2002 සැප්තැම්බර් 02 දින සිට 2012 අගෝස්තු 06 දින දක්වා ගෙවූ වැටුප් හා දීමනා සහ ගෙවූ අමතර ප්‍රතිලාභ කිසිවක් අය කරගැනීමට කටයුතු නොකර 2012 සැප්තැම්බර් 06 දින රු. 59,640 ක පාරිතෝෂිත මුදල්ද ගෙවා 2013 පෙබරවාරි 05 දින සේවයෙන් පහ කර තිබුණි. | ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම නිලධාරියා අංක 2K13.PC.199F හා 2013 ජනවාරි 23 දින කොමිෂන් සභා තීරණය මගින් සේවයෙන් පහකර ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | රජයට සිදුවූ අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කරගත යුතුය. |

**3.7 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කොමිෂන් සභාවේ වාහනවලට අත්තිකාරම් මගින් ඉන්ධන සැපයීම** | | |
| (i) | රටේ ඉන්ධන අර්බුදය පැවති කාල වකවානුවක කොමිෂන් සභාවේ වාහනවලට ඉන්ධන සපයා ගැනීම සඳහා සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත රු. 200,000, රු. 300,000 වැනි විශාල වටිනාකම්වලින් අත්තිකාරම් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වාහන 27 කට අත්තිකාරම් වලින් රු. 388,965 ක ඉන්ධන ලබාගෙන තිබුණු බවට බිල්පත් ඉදිරිපත් කළද එම ඉන්ධන වාහනවලට සපයා නොතිබුණි. වාහන 07 ක සැපයූ ඉන්ධන ප්‍රමාණයද බිල්පත්වල දක්වා නොතිබුණි. | කොමිෂන් සභාවේ වාහන වලට ඇනවුම් මගින් ඉන්ධන සැපයූ නාවල ආයතනය ඉන්ධන අර්බුදය හේතුවෙන් ඉන්ධන ඇණවුම් මත ලබා දීමට නොහැකි බව 2022 ජූලි 06 දින දැනුම් දෙන ලදී.<br>පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් කිසිදු ඉන්ධනහලක් ඉන්ධන ඇනවුම් මත ඉන්ධන ලබා දීමට එකග නොවිය.<br>අඛණ්ඩ විදුලි සංදේශ සේවා සැපයුමක් නිරතුරුව පවත්වාගෙන යාමේ වගකීම කොමිෂන් සභාවේ වගකීම බැවින් අත්තිකාරම් මුදල් ලබා ගෙන ඉන්ධන ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සිදු විය. ඒ අනුව වාහන වලට අඛණ්ඩ ඉන්ධන සැපයුමක් තහවුරු<br><br>කරගැනීම සඳහා සහ වාහන කිහිපයක් දින ගණන් පෝලිම්වල රඳවා තබා ඉන්ධන ලබා ගැනීමට සිදු වූ නිසාත් ඉන්ධන ලැබෙන ඉන්ධනහල් පුරෝකථනය කර ගත නොහැකි තත්වයක් තිබූ නිසා ඉන්ධන ලබාගත හැකි ඉන්ධන හලකින් ඉන්ධන ලබාගත හැකි වීම තහවුරු කර ගැනීම සඳහාත්, සියලුම වාහන වලට ඉන්ධන සැපයිය හැකි වටිනාකමට ප්‍රමාණවත් අත්තිකාරම් ලබා ගැනීමට සිදු විය.පාලන කටයුතු පවරා සිටි අධ්‍යක්ෂ (පාලන) වෙත අත්තිකාරම් නිකුත් කර ඇත. ඉන්ධන ප්‍රමාණය නොදක්වා ඇති බිල්පත් වල ඉන්ධන ලබා ගත් මුදල් වටිනාකම දක්වා ඇත. ධාවන සටහන් වල ඉන්ධන ප්‍රමාණයදක්වනු ලැබේ. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | සහකාර අධ්‍යක්ෂ (පාලන) 2022 අගෝස්තු 25 දින වාහනයකට ඉන්ධන ලබාගැනීම සඳහා රු. 21,500 ක ඉන්ධන අත්තිකාරමක් ලබාගෙන තිබුණු අතර එය පියවීමේදී ඩීසල් ලීටර් 50 ක් මිලදී ගත් බවට බිල්පත් ඉදිරිපත් කර තිබුණද වාහනයට සපයා ඇති ඉන්ධන ප්‍රමාණය ඩීසල් ලීටර් 20 ක් විය. | අත්තිකාරම් ලබා දීමේ ක්‍රමවේදය හේතුවෙන් මාණ්ඩලික නිලධාරියෙකු අත්තිකාරම් ලබා ගත්තද ඉන්ධන ලබා ගැනීම සඳහා රියදුරු සමග ඉන්ධන හල වෙත යාමට පවරා තිබෙනුයේ ප්‍රවාහන විෂයභාර නිලධාරියාට වේ. එබැවින් මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරමින් පවතී. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | වාහන 92 කට අත්තිකාරම් වලින් රු. 1,335,693 ක ඉන්ධන ලබාගෙන තිබුණද එම වාහනවල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් මිලදී ගත් ඉන්ධන අදාළ වාහනවලට යෙදවූවාද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය. අවස්ථා 13 ක වාහනවලට සැපයූ ඉන්ධන ප්‍රමාණයද බිල්පත්වල දක්වා නොතිබුණි. | අදාළ ධාවන සටහන් ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **වාහන අපහරණය** | | |
| (i) | අපහරණ ඇගයීම් කමිටුව විසින් 2020 ජූලි 22 දිනැති තක්සේරු වාර්තා වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී ඇති බවත්, වර්තමානයේ වාහන ආනයනය තහනම් කර ඇති බැවින් වාහන මිල ගණන් ඉහළ අගයක්ගන්නා බවත් ඒ හේතුවෙන් නව තක්සේරු වටිනාකම් ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබියදී කොමිෂන් සභාව විසින් 2020 වර්ෂයේ තක්සේරු වාර්තා පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුළ වාහන 04 ක් රු. 4,877,616 කට විකුණා තිබුණි. | මෙම කාලය තුළ රටේ පැවති ආර්ථික අර්බුදය, ඉන්ධන අර්බුදය හා කොවිඩ් වසංගතය තත්ත්වයහේතුවෙන් කාර්යාල කාර්ය මණ්ඩල සීමාසහිතව කාර්යාල වෙත කැඳවීම ආදී හේතුන් මත වෙන්දේසි කටයුතු කිරීම සඳහා මෙම කාලය ගත විය. මෙමවාහන වසර ගණනාවක් භාවිතයට නොගෙන ගාල්කර තැබීම හේතුවෙන් දිනෙන් දින අබලන් වෙමින්පැවති හෙයින් තව දුරටත් අලාභයක් සිදු වීම වලක්වා ගැනීමේ අරමුණින් 2020 ජූලි 22 තක්සේරු වාර්තාපදනම් කර ගෙන වෙන්දේසි කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන ලදී. මෙම වාහනවල තක්සේරුවටිනාකම රු. 2,010,000 වු අතර වෙන්දේසියේදී ලාභය ලෙස රු.2,867,616 ක මුදලක් උපයා ගතහැකි විය. වාහන මිල ඉහල යාමේ වාසිය ආයතනයට ලබා ගෙන ඇත. | ඉදිරි වාහන අපහරණ කටයුතුවලදී විධිමත් තක්සේරු වාර්තා පදනම් කරගත යුතු අතර අවිධිමත් තක්සේරු වාර්තා යොදාගෙන වාහන අපහරණයන් සිදු කළ නිලධාරීන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | වාහනයක් සඳහා තක්සේරු වටිනාකමට සමාන හෝ වැඩි අගයක් සහිත ලංසු ඉදිරිපත් නොවීම හේතුවෙන් නැවත ලංසු කැඳවීමට අපහරණ ඇගයීම කමිටුව නිර්දේශ කර තිබුණද එම නිර්දේශ ක්‍රියාත්මක නොකර ලංසු ඉදිරිපත් කිරීමේදී රු. 310,900 ක වැඩිම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු තක්සේරු වටිනාකම වූ රු. 520,000 කට වාහනය මිලදී ගැනීමට කැමැත්ත දැක්වීම හේතුව ලෙස දක්වමින් එම ලංසුකරුට තක්සේරු වටිනාකමට වාහනය විකුණා තිබුණි. | එවකට රටේ පැවති සීමා කිරීම් සහ වෙන්දේසි කිරීමේ ක්‍රියාවලිය සඳහා ලංසු කැඳවීමට ගතවනකාලය, වියදම හා දුෂ්කරතාවන් සැළකිල්ලට ගෙන 2022 ජනවාරි 27 දින පැවති කොමිෂන් සභා තීරණය හා අනුමැතිය මත අංක 227 – 8280 දරන රථය තක්සේරුවටිනාකමට වෙන්දේසි කරන ලදී. | රජයට සිදුවූ අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | වාහනයක් සඳහා දෙවන වැඩිම මිල ඉදිරිපත් කළ ලංසුකරු තක්සේරු වටිනාකම වූ රු. 520,000 ට අඩුවෙන් ලංසුව ඉදිරිපත් කළද ඔහුගේ ඉල්ලීම පරිදි තක්සේරු වටිනාකමට මෙම වාහනය විකුණා තිබුණි. | අංක 227 – 8280 දරන රථය තක්සේරු වටිනාකමට ලබා දීමට කොමිෂන් සභාව ලබා දුන් අනුමැතියඅනුගමනය කරමින් අංක227 – 8426 දරන රථය තක්සේරු වටිනාකමට වෙන්දේසි කරන ලදී. | රජයට සිදුවූ අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කරගත යුතුය. |
| (iv) | කොමිෂන් සභාව විසින් ලංසු ලේඛනවල එකතු කළ අගය මත බදු අයකර ගැනීම පිළිබඳව දක්වා නොතිබීම හේතුවෙන් වාහනයක්රු. 1,200,000 කට මිලදී ගත් ලංසුකරු එකතු කළ අගය මත බදු ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 88,889 කින් අඩුවී තිබුණු අතර ලංසු ලේඛන නිසි පරිදි සකස් නොකළ නිලධාරීන් හඳුනාගෙන කොමිෂන් සභාවට වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනයේ තක්සේරු මිළ වූ රු. 520,000 ට එකතු කළ අගය මත බදු එකතු කළ මිල වුවත්රු. 1,200,000 මුදලට ඉහලම ලංසුකරුටලංසුව පිරිනැමීම මඟින් අංක 227 – 8430 දරණ රථයේ තක්සේරු වටිනාකමට වැඩියෙන් රථය වෙන්දේසිකිරීමට හැකියාව ලැබුණි.දෙවන ලංසු කරුගේ ලංසුව තක්සේරු අගයට වඩා අඩු වීම නිසා ද නැවත ලංසුකැඳවීමට යන කාලය සහ වියදම ද එහිදී මෙම රථයට මීට වඩා ඉහල වටිනාකමක් ලැබීමේ තහවුරුවක්නොමැති වීමද යන කරුණු සලකා බලා මෙම රථය ඉහත මුදලට වෙන්දේසි කරන ලදී. | ලංසු ලේඛන නිසි පරිදි සකස් නොකළ නිලධාරීන් හඳුනාගෙන කොමිෂන් සභාවට වූ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ10 වගන්තිය ප්‍රකාරව වාහන අපහරණය කිරීමේදී සියලුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද කොමිෂන් සභාව විසින් වාහන විකිණීමෙන් ලැබුණු රු. 4,877,616 ක මුදල බැර කර නොතිබුණි. | 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22 “ඊ”(2) (ඇ) වගන්තිය අනුවමෙම මුදල් බැර කල යුත්තේ ඒකාබද්ධ අරමුදලට නොව කොමිෂන් සභාවේ අරමුදලට වේ. ඒ අනුව කටයුතුකර ඇත. | පිළිතුරේ දක්වා ඇති පරිදි පනතේ විධිවිධාන සලසා නොමැති බැවින් 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 අංක 10 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වියදම් අයිතම 10ක අයවැයගත වියදම ඉක්මවා රු. 515,459,337ක් වැයකර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 13සිට සියයට 313 දක්වා පරාසයක් තුළ පැවතුණු බව නිරීක්ෂණය විය. | මෙම අසාමාන්‍ය වියදම් වැඩිවීමට හේතු වන්නේ,<br>- 2022 පෙබරවාරි මාසයේ සිට රු. 5,000 කවැටුප් වැඩි වීමෙන්වෙනත් දීමනා වැඩිවීම.<br>- ද්විතියික පදනම මත 2022 පෙබරවාරි මාසයේ සිට බඳවා ගන්නා ලද සහකාර අධ්‍යක්ෂ පාලන තනතුරට අදාළ විශ්‍රාම වැටුප් දායක මුදල ඉහළ යාම.<br>- විශ්‍රාම ගැන්වීමේ වයස 2022 වර්ෂය තුළදී අවුරුදු 65 සිට 60 දක්වා අඩු කිරීම මත සේවකයන්විශ්‍රාම යාම වැඩිවීමෙන් | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පාරිතෝෂිත ගෙවීම් වැඩිවීම.<br>- කොමිෂන් සභා තීරණයක් මත කොළඹ නෙළුම් කුලුන සමාගමෙන් අය කරගත යුතු රක්ෂණ දායක මුදල කොමිෂන් සභාවේ වියදමක් ලෙස සැලකීමෙන් වියදම වැඩිවීම.<br>කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය යටතේ තිබූ වත්කම් 2022 වර්ෂයේ ප්‍රග්ධනිත කිරීම නිසා වත්කම්වැඩිවීමෙන් ක්ෂය කිරීම් ඉහළ යාම. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණු නියාමන වියදම් යටතේ ඇති වියදම් අයිතම 03 ක් සඳහා රු. 152,389,962 ක වියදමක්ද හා ආයතන සහ පරිපාලන වියදම් යටතේ ඇති වියදම් 11 ක් සඳහා රු. 514,696,496 ක වියදමක්ද සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණි. | 2022 වර්ෂයේ අයවැය ලේඛනයේ සටහන් අංක 03, 09, 10 වෙත ඔබගේ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලාසිටිමු. | අයවැය සටහනේ අංක 03, 09, 10ඉදිරිපත් කර නොතිබුණු අතර අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |